# 19 වාර්ෂික සේවා වාර්තාව

සර්වෝදය ශාන්ති සේනා සංසදය

පිළිගැන්වීම


ගරුතර මහා සංඝයා වහන්ස,
ප්‍රධාන ආරාධිත අමුත්තනි,
ගරු සභාපතිතුමනි,
විධායක සභික මහත්වරුනි/නෝනාවරුනි,
සාමාජික සාමාජිකාවනි,
ආරාධිත අමුත්තනි,
පින්වත් නංගී/මල්ලී,

සක්‍රීය තරුණ සංවිධානයක් වශයෙන් ලාංකේය සමාජය තුළ සලකුණු තැබූ ශාන්ති සේනා සංසදයට මෙම වර්ෂයට වසර 30ක් සපිරෙන බව පළමුව සතුටින් සිහිපත් කරමි. සර්වෝදය ශාන්ති සේනා සංසදය 2007 අප්‍රේල් 01 වන දින සිට 2008 මාර්තු 31 දක්වා වු වර්ෂය තුළ සිදුකරන ලද විවිධ සේවාවන් පිළිබඳ වු සේවා වාර්තාව සංසදයේ **19 වන සාංවත්සරික මහ සභාව** වෙනුවෙන් එහි ප්‍රධාන ලේකම් වන මා විසින් ඉතා සතුටින් ඉදිරිපත් කරමි·

**නීතිඥ ශ්‍රීනාත් පෙරේරා,**
ප්‍රධාන ලේකම්,

2008 ·12·13
ශාන්ති සේනා තරුණ ක්‍රියාකාරී මධ්‍යස්ථානයේදී

සර්වෝදය ශාන්ති සේනා සංසදය,
අංක : 72/5,
රාවතාවත්ත පාර,
මොරටුව.



## ශාන්ති සේනා
## සභාපති තුමාගේ පණිවුඩය

සර්වෝදය ශාන්ති සේනාව තිස්වසරක අභිමානනීය ගමනක පැමිණි බව අපට සතුටින් සිහිපත් කළ හැකිය. එය අප ශාන්ති සේනාව සමඟ සම්බන්ධ වී සිටින එක්ලක්ෂ විසි දහසකට අධික සාමාජිකත්වයේ ජයග්‍රහනයකි. අදට 30 වසරකට පෙර දිනෙක ශාන්ති සේනාව ආරම්භ කරමින් සර්වෝදය සභාපති ඒ.ටී. ආරියරත්න මහතා විසින් තබන ලද බලාපොරොත්තුව පුළුල් පදනමකින් විග්‍රහ කළ යුත්තකි.


පසු ගිය දා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති අපගේ තිස්වසර සැමරීමේ උත්සවයට සහභාගි වෙමින් එතුමා විසින් පවත්වන ලද කථාවේ මෙම සමස්තය අන්තර්ගතව තිබුණි. ශාන්ති සේනාව එක් එක් සාමාජිකයා තුළ මිනිස්කමේ උදාරත්වය අවදිකරන්නක් මෙන්ම ජාතික ප්‍රාර්ථනා ඉටු කරන්නක් ද වන්නේය. විපතට, දුකට, වේදනාවට පත් ජනතාව සොයා ගොස් ඔවුන්ට සහන සැලසීමෙන් අපගේ සේවාව අවසන් නොවන්නේය. සර්වෝදය උදාර ප්‍රාර්ථනා මිනිස් හදවත් තුළ ස්ථාපිත කෙරෙන දිර්ඝ ව්‍යායාමයක අපි නිරත වන්නෙමු.

බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති අපගේ තිස් වසර සැමරීමේ උත්සවය හා ඒ හා සමගාමීව සිදුකළ සියලු කටයුතු මැනවින් සංවිධානය කර තිබු බව සර්වෝදය ගරු සභාපති තුමා මා වෙත සඳහන් කළ බව ඔබට දැන්වීමට මෙය අවස්ථාවක් කර ගනිමි. අවංක සිතින් සේවයට කැපවීම මිනිස්කම පිළිබඳව උදාරත්වය අවදි කිරීමේ සාධකයයි. අවංක මෙහෙවර සිතට සහනයක් ගෙන දෙන අතර පුද්ගලයාට රටට ශක්තියක් වන්නේය. අවංක සේවයට කැපවන්නන් දේශයේ භාග්‍යයකි. ශාන්ති සේනාවේ චිරස්ථිතිය පවතින්නේ මේ උදාරත්වය සමගිනි.

අප ප්‍රයත්නයන්ට ශක්තියක් වන ශාන්ති සේනා නායක මණ්ඩලයටත් සර්වෝදය විධායක අධ්‍යක්ෂ වෛද්‍ය වින්යා ආරියරත්න මහතා ප්‍රධාන සර්වෝදය කාර්ය මණ්ඩලයටත් පසුගිය වසර පුරා සහයෝගය ලබා දුන් සැමටත් අප අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ස්තූතිය පුද කරමි.

ඉතා කැපවිමකින් යුතුව වැඩ කරන විධායක අධ්‍යක්ෂ රවින්ද්‍ර කන්දගේ මහතා ඇතුළු අපගේ ක්‍රියාකාරි තරුණ කණ්ඩායම් දක්වන කුසලතාවය අගය කරනු කැමැත්තෙමි. අපට සහය පළ කරන ආධාරක ආයතන පිළිබඳව ද කෘතවේදී සඳහනක් තබමි.

කමල් වලේබොඩ,
සභාපති,
සර්වෝදය ශාන්ති සේනා සංසදය.



## 01. පූර්විකාව

අහිංසාවාදී ගමන්මග යමින් ජනතාව වඩාත් බලවත් වූ සම්මා ආජීව සමාජයක් ගොඩනැගීම උදෙසා සර්වෝදය ජනතා ව්‍යාපාරය ගෙනයන්නාවූ වැඩපිළිවෙල වඩාත් ශක්තිමත් කරමින්, ලාංකේය තාරුණ්‍යය සෘජුව ආමන්ත්‍රණය කරමින්, පෞරුෂ සංවර්ධනය හරහා තාරුණ්‍යය බලවන්ත කිරීමේ සමාජ ශෝධන ක්‍රියාවලියට දායකත්වය ලබාදෙමින් කටයුතු කරන ශාන්ති සේනාව සිය නිස්සරණාධ්‍යාශී සමාජ මෙහෙවරෙහි 30 වන වසර හා ස්වාධීන අංශයක් වශයෙන් ස්ථාපිතව කටයුතු මෙහෙයවූ 19 වන වසර සපුරයි'

නැවත රටතුල උද්ගතවූ යුධමය වාතාවරණය මත" රටපුරා සිදුවූ ලේ වැගිරීම් හේතුවෙන්" කලක සිට ගොඩනැගෙමින් තිබූ විශ්වාසය ඉරිතලා යමින් ජනතාව බියෙන් ඇළලීගිය" ඉතා අභියෝගාත්මක වර්ෂයක් ලෙස මෙම වසර හැඳින්විය හැකි ය' මෙම කාලය තුළ බොහෝ සංවිධාන අක්‍රීයව සිය කටයුතු අත්හැර දමද්දී, ශාන්ති සේනාව පවතින තත්වය මැනවින් විශ්ලේෂණය කර ගනිමින් සිය මානව හිතවාදී ක්‍රියාකාරකම් වඩාත් ප්‍රබලව හා පුළුල්ව ක්‍රියාත්මක කරන ලද්දේ සාමාන්‍ය ජනතාව අතර බිඳී යමින් පවතින සහජීවනය" මිත්‍රත්වය හා විශ්වාසය" ගොඩනැගීමෙහිලා ප්‍රමුඛත්වයක් ලබාදෙමිනි. අන් කිසි දිනකටත් වඩා සමාජ සත්කාරයන්හි අවශ්‍යතාව මෙවන් තත්වයක් තුල ඉටුවිය යුතු බව තේරුම් ගත් ශාන්ති සේනාව මෙම වර්ෂය තුළ දැඩි අභියෝග හා දුෂ්කරතා රාශියක් මධ්‍යයයේ වුව ද ඒ සියල්ල උපේක්ෂාසහගතව විඳගනිමින් වඩාත් සංවිධානාත්මකව යාහැකි උපරිම තත්වය දක්වා සිය කාර්යයන් මෙහෙයවීමට කටයුතු කරන ලදි'

පැවති තත්වය මත ශාන්ති සේනාව සිය සාමාජිකත්වය දරන ශ්‍රී ලාංකේය තරුණ ප්‍රජාවගේ සක්‍රීය සහභාගීත්වය යටතේ ජනතා ආකල්ප කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇතිවන අයුරින් වැඩසටහන් මෙහෙයවනු ලැබූ අතර, වඩා යහපත්වූත් ස්වාධීනවූත් සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීම උදෙසා ප්‍රධාන කෙෂ්ත්‍ර තුනක් ඔස්සේ මෙම වසර තුළ ක්‍රියාත්මක විය.

- ජාතික සාමය, සමගිය හා ඒකාබද්ධතාවය සඳහා වූ වැඩසටහන්
- තරුණ නායකත්වය හා පෞරුෂ සංවර්ධනය සඳහා වු වැඩසටහන්
- ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන්

අදාල කාලය තුල ඉහත කෙෂ්ත්‍රයන් හි ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් හරහා ශාන්ති සේනා තරුණ සාම බලකායට උතුරු නැගෙනහිර ඇතුළුව නව ඒකක 244 ක් එකතුවී ඇති අතර ඒ හා සම්බන්ධ වු නව සාමාජිකයින් ගණන 5697 කි.

දශක තුනක අත්දැකීම් සහිත ශාන්ති සේනාව මනා පන්නරයක් ලද තරුණ සංවිධානයක් බවට පත්ව ඇත. එම අත්දැකීම් නැවත නැවතත් සැලකිල්ලට ගනිමින් කාලයට හා සමාජයට යෝග්‍ය අයුරින් වෙනස් වෙමින් කටයුතු මෙහෙය වීමට නිරන්තරයෙන් උත්සාහ ගැනිණි.

යුධමය මානසිකත්වයකින් මුලු සමාජ දේහයම වසා ගනිමින් තිබියදී, සාමය හා සහජීවනය වැනි සංකල්පයන් පවා අභියෝගයට හා ගැරහුමට ලක්වූ පරිසරයක් තුළ සිදුවිය හැකි හානි අවම කරගනිමින් කටයුතු කිරීමට ශාන්ති සේනාවට හැකියාව ලැබුණේ කෙෂ්ත්‍රය පිළිබඳව ඇති ස්වයං පළපුරුද්ද හා පුළුල් විශ්ලේෂණය හේතුවෙනි.

වර්ධනය වෙමින් පවතින යුදමය තත්වය තුළ සාමාන්‍ය ජනතාව අතර ඇතිවිය හැකි ගැටුම් අවම කිරීම උදෙසාත්, මානව ගරුත්වයෙන් හා දයාවෙන් යුත් සහජීවන සමාජයක් ගොඩනැගීම සඳහාත් ජනතාව පුළුල් වශයෙන් දැනුවත් කිරීමට හා සංවිධාන ගත කිරීමට ආගමික නායකයින්ට හා ආගමික හරපද්ධතීන්ට ඇත්තේ ඉමහත් ශක්තියකි. එම ශක්තිය සහජීවන සමාජයක් ගොඩනැගීම සඳහා නිවැරදිව යොදාගැනීමට ආගමික නායකයින්ගේ ඒකාබද්ධතාවයක් ඇති කිරීමට ශාන්ති සේනාවට හැකියාව ලැබුනු අතර, ගැටුම්කාරී තත්වයන් වැඩි වශයෙන් බල පවත්නා දිස්ත්‍රික්ක 12 ක් තුළ ආගමික සංවාද වැඩසටහන් පවත්වා ආගමික නායකයින් සිවිල්

ප්‍රජා නායකයින් හා තරුණ ක්‍රියාකාරීන් 630 කගෙන් සැදුම් ලත් කමිටු 12ක් දිස්ත්‍රික්ක තුළ ස්ථාපනය කෙරිණි. තව දුරටත් කලාපීය වශයෙන් සහජීවනයට ඇතිවන බලපෑම් අවම කර ගැනීමටත් ඒ සඳහා වැඩසටහන් නිර්මාණය කර ගැනීමටත් දිස්ත්‍රික් මට්ටමේ ප්‍රධාන ආගමික නායකයින් එක්කොට කලාපීය ආගමික නායක සමුළු 04ක් 513 දෙනෙකු ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි. මෙම වැඩසටහන්හිම අනුගමනීය කාර්යයක් වශයෙන් උතුරු නැගෙනහිර හා දකුණේ දිස්ත්‍රික්කයන්හි විවිධ වාර්ගික හා ආගමික තරුණ කණ්ඩායම් එක්කොට ඔවුනොවුන්ගේ සංස්කෘතීන් ආගමික හරයන් හා භාෂාවන් පිළිබඳ අත්දැකීම් හුවමරු කරගැනීම සඳහා අන්තර් ආගමික තරුණ හුවමාරු කඳවුරු 12ක් 1804 දෙනෙකු ගේ සෘජු සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කෙරිණි.

ක්‍රීඩාව හා මානව චර්යාවන් තුළ ඇති වෙන්කල නොහැකි සබඳතාව ක්‍රමෝපායිකව භාවිත කරමින් ක්‍රීඩාව හා විවිධ ක්‍රියාකාරකම් හරහා සමාජ හා වාර්ගික සහජීවනය ශක්තිමත් කරලීමේ අරමුණින් ගැටුම් විපර්වර්තන වැඩසටහනක් විවිධ වාර්ගික හා ආගමිකයින් ජීවත්වන දිස්ත්‍රික්ක 07 ක ගම්මාන 21ක් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලද අතර, 1232 දෙනෙකු මෙම ක්‍රීඩා සමාජයන්හි සාමාජිකත්වය දරයි. එසේම මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණුකරුවන්ගේ පුහුණුව ලත් 16 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් කටයුතු කරනු ලබයි.

ක්‍රීඩාව හා සාමූහික විනෝදාතමක ක්‍රියාකාරකම් තුලින් විවිධ වාර්ගික තරුණ කණ්ඩායම් අතර නායකත්වය හා සුහදත්වය වර්ධනය කරලීමේ අරමුණින් දිස්ත්‍රික්කය ම ආවරණය වන පරිදි එක්දින ක්‍රීඩා වැඩසටහන් 08ක් දිස්ත්‍රික්ක 08ක් තුල 1098 දෙනෙකු ගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කර ඇත.

ගමට ගමක් - හදට හදක් තේමාව යටතේ ලාගෝස්වත්ත, නින්දවූර්, හා වඩ්ඩවාන් සිංහල, දෙමළ, මුස්ලිම් සර්වෝදය ගම්මාන එක්කරමින් විශේෂ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කෙරිණි. මොරටුව ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් ප්‍රදේශයේ සහජීවනය ඇතිකිරීමේ අරමුණින් ආගමික හා සිවිල් නායකයින්ගේ එකතුවෙන් අන්තර් සහජීවන සංවර්ධන පදනම නමින් නව සංවිධානයක් නිර්මාණය කිරීමද පසුගිය වසරේ සිදුකළ වැදගත් කාර්යයක් ලෙස සැළකිය හැකිය.

ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලින් ඔබ්බට යමින් ඇරඹි තරුණ නායකත්ව හා පෞරුෂ සංවර්ධන වැඩසටහන යටතේ මේ වනවිට ග්‍රාම ස්වරාජ්‍ය ගම්මාන හා ඉල්ලුම් කරන ලද දිස්ත්‍රික්කයන්හි තරුණ නායකයින් පුහුණු කිරීමේ වැඩසටහන් 03ක් පවත්වා තරුණ නායකයින් 113 දෙනෙකු සමාජ සත්කාරක සේවයේ යොදවා ඇත.

නිරෝගී මානව පරපුරක් බිහිකිරීමේ අරමුණින් බෝවන හා බෝනොවන රෝග නිවාරණයට හා පාලනය කිරීමට මූලිකත්වය දෙමින් ක්‍රියාත්මක සුවදාන සේවා වැඩසටහන මෙම වර්ෂය තුළ ක්‍රියාත්මක තවත් එක් සාර්ථක වැඩසටහනකි. මේ යටතේ ගම්මාන රැසක සුවදාන සේවා උපදේශකයින් 508 දෙනෙකුට පුහුණු වැඩසටහන් 16ක් තුළ දී විධිමත් පුහුණුවක් ලබා දී ඇත. සමස්ත වැඩසටහන පිළිබඳව රජයේ සෞඛ්‍ය නිලධාරීන් හා ගම්මානයන්හි අනෙකුත් නායකයින් දැනුවත් කිරීම සඳහා එක්දින සෞඛ්‍ය සම්මේලන 12ක් 938 දෙනෙකු ගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කර ඇත. පුහුණුව ලැබූ කණ්ඩායම් අදාල නිර්ණායක සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ගම්මාන 143 ක් සඳහා සුවදාන සේවා මධ්‍යස්ථාන ලබා දීමට කටයුතු කර ඇති අතර, මේ වන විට විශාල ජනතාවක් මෙම සුවදාන සේවා මධ්‍යස්ථානයන්හි සේවය නිරන්තරයෙන් ලබාගන්නා බව වාර්තාවේ.

ඉහත සඳහන් ප්‍රධාන කාර්යයන් මෙන්ම සංසදයේ සෘජු මැදිහත්වීම යටතේත් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සේවා හා වැඩසටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වූ අතර, ඒ පිළිබඳ තොරතුරු ද මෙම සේවා වාර්තාවේ අන්තර්ගත වේ.


ශ්‍රී ලාංකේය තාරුණ්‍යය ඉලක්ක කර ගනිමින් සියල්ලන්ගේම සතුට සුවය හා සාමය උදෙසා වූ දශක තුනක සමාජ සත්කාර්යය මෙතෙකින් අවසන් නොවන බව ද, එළඹෙන ඉදිරි දශකය ලක් ඉතිහාසයේ තීරණාත්මක කාලයක් වනු නිසැක බව ද සඳහන් කරනු කැමැත්තෙමි.

## 02. ශාන්ති සේනා ඒකක හා සාමාජික වර්ධනය

| දිස්ත්‍රික්කය | 2006 / 2007 වර්ෂයට | | 2007/2008 | | 2008 මාර්තු 31 ට | |
|---|---|---|---|---|---|---|
| | ඒකක | සාමාජික | ඒකක | සාමාජික | ඒකක | සාමාජික |
| අම්පාර | 118 | 9367 | 09 | 205 | 127 | 9572 |
| මහියංගනය | 444 | 4436 | 04 | 107 | 448 | 4543 |
| ත්‍රිකුණාමලය/බ | 438 | 5171 | 04 | 95 | 442 | 5266 |
| ගම්පහ | 248 | 3021 | 18 | 429 | 266 | 3450 |
| මහනුවර | 705 | 6412 | 19 | 466 | 724 | 6878 |
| නුවරඑළිය | 228 | 2880 | 08 | 128 | 236 | 3008 |
| කුරුණෑගල | 676 | 8710 | 28 | 682 | 706 | 9392 |
| පුත්තලම | 335 | 4759 | 19 | 454 | 354 | 5213 |
| අනුරාධපුර/බටහිර | 271 | 3606 | 05 | 150 | 276 | 3756 |
| පදවිය | 132 | 1617 | 12 | 292 | 144 | 1909 |
| බදුල්ල | 362 | 5268 | 14 | 429 | 376 | 5697 |
| කෑගල්ල | 410 | 4931 | 10 | 266 | 420 | 5197 |
| ගාල්ල | 632 | 6628 | 08 | 149 | 640 | 6777 |
| කළුතර | 753 | 7683 | 05 | 69 | 758 | 7752 |
| රත්නපුර | 666 | 6676 | 02 | 44 | 668 | 6720 |
| මොණරාගල /උතුර | 230 | 2628 | 05 | 101 | 235 | 2729 |
| මොණරාගල/දකුණ | 196 | 2033 | 01 | 20 | 197 | 2053 |
| හම්බන්තොට | 213 | 2477 | 01 | 22 | 214 | 2499 |
| මඩකලපුව | 145 | 1805 | 02 | 36 | 147 | 1841 |
| කොළඹ /නැගෙනහිර | 158 | 1829 | - | - | 158 | (1829) |
| කොළඹ / බටහිර | 128 | 1432 | - | - | 128 | (1432) |
| කල්මුණේ | 318 | 3455 | 10 | 196 | 328 | 3651 |
| නගරෝදය | 70 | 712 | - | - | 70 | (712) |
| අනුරාධපුර /නැගෙනහිර | 126 | 2604 | 13 | 269 | 139 | 2873 |
| පොළොන්නරුව | 164 | 2361 | 13 | 373 | 177 | 2738 |
| වව්නියාව | 204 | 2285 | 13 | 269 | 217 | 2554 |
| මාතර | 381 | 4010 | 07 | 171 | 388 | 4181 |
| මාතලේ | 181 | 2250 | 05 | 95 | 186 | 2345 |
| ත්‍රිකුණාමලය/නැ | 64 | 783 | 08 | 161 | 72 | 944 |
| මන්නාරම | 58 | 768 | - | - | 58 | 768 |
| යාපනය | 81 | 1032 | 01 | 19 | 82 | 1051 |
| එකතුව | 9835 | 113629 | 244 | 5697 | 10079 | 119326 |


වගු අංක 01

## 02.1. ශාන්ති සේනා සාමාජික වර්ධනය




රේඛා ප්‍රස්ථාර අංක 01

## 02.2. ශාන්ති සේනා ඒකක වර්ධනය




ස්ථම්භ ප්‍රස්ථාර අංක 01

## 03. ක්‍රියාත්මක වැඩසටහන් සම්පිණ්ඩනය

| අංක | වැඩසටහන | සංඛ්‍යාව | සහභාගීත්වය |
|---|---|---|---|
| 01 | අන්තර් ආගමික සංවාද | 12 | 630 |
| 02 | අන්තර් ආගමික තරුණ හුවමාරු කඳවුරු | 12 | 1804 |
| 03 | අන්තර් ආගමික කළාපීය නායක සමුළු | 04 | 513 |
| 04 | සාම බලකා පුහුණු | 01 | 30 |
| 05 | ගමට ගමක් හදට හදක් වැඩසටහන | | |
| 06 | සාම ක්‍රීඩා පුහුණුකරුවන් පුහුණු කිරීම | 01 | 16 |
| 07 | සාම ක්‍රීඩා සමාජ පිහිටුවීම | 27 | 1134 |
| 08 | අන්තර් වාර්ගික ක්‍රීඩා වැඩසටහන | 08 | 1098 |
| 09 | ග්‍රාම ස්වරාජ්‍ය නායකත්ව පුහුණු | 02 | 83 |
| 10 | සුවදාන සේවා උපදේශක පුහුණු | 16 | 508 |
| 11 | සුවදාන සේවා එක්දින සෞඛ්‍ය සම්මන්ත්‍රණ | 12 | 938 |
| 12 | සුවදාන සේවා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම් | 143 | 28650 |
| 13 | සිහින මළු ප්‍රදානය | 3494 | 3494 |

වගු අංක 02

## 04. වැඩසටහන් හැඳින්වීම


**අන්තර් වාර්ගික හා ආගමික සහජීවනය සඳහා වූ වැඩසටහන්**

වාද බේද කොටු පවුරු
බිඳැර අපි . . . . . .

ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින විවිධ වාර්ගික හා ආගමික කණ්ඩායම් අතර අවබෝධය හා විශ්වාසය ගොඩනැගීම තුළින් සහජීවනයෙන් යුතුව ජීවත් වීමට අවැසි පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා වැඩසටහන් මාලාවක් අදාල වර්ෂය තුළ ශාන්ති සේනා සංසදය විසින් ක්‍රියාත්මක කරන ලදී.

විවිධත්වය තුළ විශ්වසනීයත්වය හා අන්‍යෝන්‍ය ගරුත්වය ගොඩනැගීම උදෙසා ජන විඥානය අවදි කිරීමත්, එමගින් තිරසාර සාමයකට මං පෙත් විවර කරගැනීමත්, සඳහා වූ දුෂ්කර, අභියෝග සම්පන්න ගමන දශක තුනකට ආසන්න කාලයක සේවා අත්දැකීම් හා ශාන්ති සේනා ක්‍රමෝපා සැලැස්මට අනුව යමින් සාර්ථක කර ගැනීමට සර්වෝදය ශාන්ති සේනාව සමත්විය.

සහජීවන සමාජයක් නිර්මාණය කිරීම උදෙසා ශ්‍රී ලාංකේය තාරුණ්‍යය පෙළඹවීමේ හා බලවන්ත කිරීමේ කාර්යයෙහි සාධනීය වර්ෂයක්වූ මෙම වර්ෂය තුළ අප වැඩසටහන් ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා වූ විවිධ තලයන්හි ක්‍රියාත්මක විය.



### 04.1. අන්තර් ආගමික සංවාද වැඩසටහන

ශාන්ති සේනා ගැටුම් සමථකරණ හා නායකත්ව පුහුණුව ලබා ගන්නා තරුණ නායකයින් තම ගම්මාන තුල ආරම්භ කරන ලද අන්තර් ආගමික තරුණ ඒකක (ශාන්ති සේනා ඒකක) සමග ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා ආගමික නායකයින්ගේ හා ප්‍රජා නායකයින්ගේ සහයෝගය ලබා ගැනීම උදෙසාත්, දිස්ත්‍රික්කයේ ආගමික සහජීවනය වර්ධනය කරලීමට අවශ්‍ය ප්‍රජා සහයෝගීතාවය හා විශ්වාසය ඇතිකරලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිසත්, මෙම වැඩසටහන සංවිධානය කෙරිණි' විශේෂයෙන්ම අනුගමනීය වැඩ සටහන් මෙහෙයවීම උදෙසා අන්තර් ආගමික සහයෝගීතා කමිටුවක් ස්ථාපිත කර ගැනීම ද, ක්‍රියාත්මක වැඩසටහන් සඳහා ආගමික නායකයින්ගේ සක්‍රීය දායකත්වය ලබා ගැනීම ද මෙමගින් අපේක්ෂා කෙරිණි. අදාල දිස්ත්‍රික්කයන්හි සියලු වැඩසටහන් සඳහා එම ආගමික නායකයින්ගේ ආශිර්වාදයත් සහයෝගයත් ලබා ගැනීමට ද හැකියාව ලැබුණි'




**ඡායා 01** රටට අවැසි දේ මතුකර ගනිමින්




**ඡායා 02** සංවාද වැඩසටහනක අවස්ථාවක්

### 04.1.1. අන්තර් ආගමික සංවාද වැඩසටහන් සඳහා සහභාගීත්වය

| අංං | ස්ථානය | දිනය | සහභාගීත්වය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ඉලක්කය | සහභාගි ත්වය | බෞද්ධ | හින්දු | ඉස්ලාම් | කතෝලික |
| 01 | පොළොන්නරුව | 11 මැයි 07 | 50 | 45 | 32 | - | 09 | 04 |
| 02 | කළුතර | 15 මැයි 07 | 50 | 51 | 29 | 05 | 10 | 07 |
| 03 | ගාල්ල | 22 මැයි 07 | 50 | 53 | 31 | 03 | 11 | 08 |
| 04 | අනුරාධපුර/නැ | 26 මැයි 07 | 50 | 58 | 30 | 02 | 12 | 14 |
| 05 | ගම්පහ | 28 මැයි 07 | 50 | 50 | 19 | 04 | 15 | 12 |
| 06 | මහ නුවර | 05 ජුනි 07 | 50 | 50 | 37 | 06 | 01 | 06 |
| 07 | කල්මුණේ | 09 ජුනි 07 | 50 | 50 | 01 | 25 | 18 | 06 |
| 08 | ත්‍රිකුනාමලය | 13 ජුනි 07 | 50 | 46 | 17 | 26 | 02 | 01 |
| 09 | වව්නියාව | 19 ජුනි 07 | 50 | 50 | 15 | 25 | 03 | 07 |
| 10 | පුත්තලම | 11 ජුලි 07 | 50 | 77 | 42 | 10 | 05 | 20 |
| 11 | මාතලේ | 18 ජුලි 07 | 50 | 55 | 40 | 6 | 3 | 6 |
| 12 | මඩකළපුව | 20 දෙසැ 07 | 50 | 45 | 02 | 24 | 12 | 07 |
| එකතුව | | | **600** | **630** | **295** | **136** | **101** | **98** |

වගු අංක 03

## 04.2. අන්තර් ආගමික තරුණ හුවමාරු කඳවුරු

අන්තර් ආගමික තරුණයින්ගේ සහභාගිත්වයෙන් නේවාසික කඳවුරක් ලෙස පැවැවෙන මෙම වැඩ සටහන ආගමික සංවාද වැඩසටහනේ අනුගමනීය කාර්යයක් ලෙස ක්‍රියාත්මක කෙරිණි' අන්තර් ආගමික ප්‍රජාව අතර යහ ආකල්ප වර්ධනය කොට ඔවුනොවුන්ගේ භාෂාව, සංස්කෘතිය හා චර්යා රටාවන් පිළිබඳ අවබෝධයක් ලැබීමට අවස්ථාව සලසා දීම තුළින් සහජීවනය වර්ධනය කරලීමට මෙම වැඩසටහනින් අපේක්ෂා කෙරේ. නේවාසික කඳවුරක් ලෙස ක්‍රියාත්මක කෙරෙන මෙම කඳවුරු කාලය තුළ, අදාල දිස්ත්‍රික්කයේ අන්තර් ආගමික කමිටු නායකයින්ගේ, සිවිල් ප්‍රජා නායකයින්ගේ හා කඳවුරු ලාභීන්ගේ සහභාගීත්වයෙන් සංවාද වැඩසටහන්, අධ්‍යාපනික වැඩ සටහන්, අදාල ගම්මානයේ පොදු අවශ්‍යතාවක් වෙනුවෙන් වූ ශ්‍රමදාන වැඩ සටහන්, සාමූහික ක්‍රීඩා වැඩසටහන්" විවිධ සංස්කෘතික අනන්‍යතාවන් පිළිඹිබු කෙරෙන සංස්කෘතික වැඩ සටහන් ආදිය ද ක්‍රියාත්මක කරන ලදි.

විවිධ භාෂා කතාකරන විවිධ සංස්කෘතීන්ට හා ආගම් වලට අයත් තරුණ ප්‍රජාව මිශ්‍ර කරමින් දින 04ක් පුරා ක්‍රියාත්මක කෙරෙන මෙම වැඩසටහන් තුළදී දෙමළ භාෂාව කතාකරන තරුණයින් සිංහල නිවාස වල ද, සිංහල භාෂාව කතාකරන තරුණයින් දෙමළ නිවාස වල ද නේවාසිකව වැඩසටහනට සම්බන්ධවිය' මේ තුළින් කඳවුරු ලාභී සියළුම කණ්ඩායම් අතර මනා සබඳතාවක් ගොඩනැගීමට හැකියාව ලැබුණු අතර, එය වැඩසටහනේ මූලික අරමුණු සාක්ෂාත් කරගැනීමට මනාව ඉවහල් විය'

### 04.2.1. අන්තර් ආගමික තරුණ හුවමාරු කඳවුරු සඳහා සහභාගීත්වය

| අං | ස්ථානය | දිනය | සහභාගීත්ව දිස්ත්‍රික්ක | සහභාගීත්වය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ඉලක්කය | සහභාගීත්වය | බෞ | හි | ඉ | ක්‍රි |
| 01 | පොළොන්නරුව දිවිලන්කඩවල | 13-16 ජුලි 07 | මඩකළපුව කල්මුණේ පොළොන්නරුව | 100 | 180 | 70 | 55 | 45 | 10 |
| 02 | පුත්තලම හත්තිනිය | 10-13 අගෝස්තු 07 | අනුරාධපුර/බ ත්‍රීමලය/බ පුත්තලම | 100 | 178 | 97 | 09 | 28 | 44 |
| 03 | ගාල්ල දංගහවිල | 19-22 අගෝස්තු 07 | කළුතර මාතර ගාල්ල | 100 | 234 | 129 | 33 | 30 | 42 |
| 04 | ගම්පහ හෙණ්ඩිමහර | 30 අගෝ 02 සැප් 07 | කොළඹ වව්නියා ගම්පහ | 100 | 178 | 95 | 44 | 05 | 34 |
| 05 | අනුරාධපුර/නැ බණ්ඩාරපොතාන | 7-10 සැප් 07 | කුරුණෑගල ත්‍රීමලය/නැ අනුරාධපුර/නැ | 100 | 159 | 94 | 26 | 23 | 16 |
| 06 | මාතලේ වාරියපොල | 12-15 සැප් 07 | කෑගල්ල මහනුවර මාතලේ | 100 | 155 | 84 | 37 | 20 | 14 |
| 07 | අම්පාර වලගම්පුර | 14 - 17 සැප් 07 | කල්මුණේ අම්පාර | 100 | 127 | 89 | 24 | 14 | - |
| 08 | ත්‍රීමලය/බ පන්සල්ගොඩැල්ල | 11 – 14 ඔක් 07 | ත්‍රීමලය/නැ ත්‍රීමලය/බ පදවිය | 100 | 112 | 91 | 18 | - | 03 |
| 09 | මාතර අකුරුගොඩ | 18-21 නොවැ 07 | මාතර වව්නියාව | 100 | 145 | 99 | 35 | 01 | 10 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | ත්‍රීමලය/නැ සෙල්වනායගපුර | 12-15 දෙසැ 07 | ත්‍රීමලය/නැ ත්‍රීමලය/බ | 100 | 114 | 43 | 46 | 20 | 05 |
| 11 | මොණරාගල/උ දෙමටත්තාවල | 21 – 24 මාර්තු 08 | මඩකලපුව මොණරාගල/උ | 100 | 106 | 55 | 36 | 13 | 02 |
| 12 | කල්මුණේ ජලාල්පුරම් | 30 මාර් - 02 අප්‍රේ 08 | අම්පාර කල්මුණේ | 100 | 116 | 59 | 25 | 31 | 01 |
| **එකතුව** | | | | **1200** | **1804** | **1005** | **388** | **230** | **181** |

වගු අංක 04



ඡායා 03 උතුරේ නෑයින් උණුසුමින් පිළිගනිමින්




ඡායා 04 වැඩසටහනට අරමුණක්



ඡායා 05 මම ඔබ වෙන්නම් ඔබ මම වෙන්න



ඡායා 06 කණ්ඩායම් ඉදිරිපත් කිරීමක්



ඡායා 07 අපි ඔක්කොම එකම දැලක් - සමූහ ක්‍රීඩා



ඡායා 08 පොයිට්ටු වාරෙන් - සංවේදී සමුගැන්ම

## 04.3. අන්තර් ආගමික කලාපීය නායක සමුළු

ග්‍රාමීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කළ අන්තර් ආගමික වැඩසටහන්" අන්තර් ආගමික තරුණ හුවමාරු කඳවුරු හා අන්තර් ආගමික සංවාද වැඩසටහන් තුළින් අදාල දිස්ත්‍රික්කයන්හි ගොඩනගන ලද අන්තර් ආගමික සහජීවන පදනම ශක්තිමත් කර ගනිමින් ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය ආගමික හා සමාජ නායකත්වයන් වර්ධනය කර ගැනීම පිණිසත් කලාපීය ආගමික සහජීවනය වර්ධනය කරලීම සඳහා අවශ්‍ය අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කර ගැනීමත්" ආගමික නායකයින්ගේ එකතුවක් තුලින් තිරසාර සාමයක් සඳහා ප්‍රබල ජන සහභාගීත්වයක් ඇතිකරලීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගැනීමත් මෙම වැඩසටහන් හරහා සිදුකරන ලදි.

පෙරකී මූලික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ග්‍රාමීය මට්ටමේ සිට රාජ්‍යත්‍රාන්තික මට්ටම දක්වා ගතයුතු ක්‍රියාමාර්ග ඇතුලත් ප්‍රඥප්ති ප්‍රකාශයට පත්කිරීම ද මෙම සමුළු හරහා සිදු කෙරුණු අතර" ජාතික මට්ටමේ බලපෑමක් සිදුකිරීමේ හැකියාව ඇති ආගමික නායකයින් මේ සඳහා සහභාගීවී පූර්ණ සහාය ලබාදීම ඉදිරි කාර්යයන් සාර්ථක කර ගැනීම උදෙසා මහඟු පිටුවහලක් විය'

### 04.3.1. අන්තර් ආගමික කලාපීය නායක සමුළු සඳහා සහභාගීත්වය

| අංං | ස්ථානය | දිනය | සහභාගීත්ව දිස්ත්‍රික්ක | සහභාගීත්වය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ඉලක්කය | සහභාගිත්වය | බෞ | හි | ඉ | ක්‍රි |
| 01 | ගාල්ල නගර සභා ශාලාව | 29 අගෝ 2007 | ගාල්ල<br>මාතර<br>කළුතර | 50 | 145 | 57 | 13 | 39 | 36 |
| 02 | කැකිරාව මධ්‍ය මහා විද්‍යාලය | 20 ඔක්තෝ 2007 | අනුරාධපුර<br>පොළොන්නරුව<br>මඩකළපුව<br>ත්‍රිමලය<br>පදවිය | 50 | 150 | 71 | 23 | 29 | 27 |
| 03 | ආණ්ඩුකාර නිලනිවස මහනුවර | 06 දෙසැ 2007 | මහනුවර<br>කල්මුණේ<br>මාතලේ | 50 | 96 | 46 | 18 | 19 | 13 |
| 04 | සර්වෝදය මධ්‍යස්ථානය ගම්පහ | 29 දෙසැ 2007 | ගම්පහ<br>කෑගල්ල<br>පුත්තලම | 50 | 122 | 57 | 16 | 21 | 28 |
| එකතුව | | | | **200** | **513** | **231** | **70** | **108** | **104** |

වගු අංක 05



ඡායා 09 කලාප එකතුව නුවර ආණ්ඩුකාර නිල නිවස



ඡායා 10 දකුණු කලාපීය ආගමික සමුළුව

## 04.4. ක්‍රීඩාව තුළින් සාමය වැඩසටහන

ශ්‍රී ලංකාවේ සමාජ හා වාර්ගික සහජීවනය ක්‍රීඩාව හා ක්‍රියාකාරකම් තුලින් ශක්තිමත් කරලීම අරමුණු කරගනිමින් "ක්‍රීඩාව තුළින් සාමය" යන තේමාව යටතේ උතුරු නැගෙනහිර හා දකුණේ දිස්ත්‍රික්ක 07 ක් තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. සහජීවනය උදෙසා විවිධත්වයෙන් යුත් ජනතාව පෙළගැස්වීමේ නවතම ප්‍රවේශයක් ලෙස ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන මීට පෙර වර්ෂයේ ද ක්‍රියාත්මක කරන ලද අතර, එහි දෙවන අදියරක් වශයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි. මේ යටතේ,

01. ක්‍රීඩා පුහුණු කරුවන් පුහුණු කිරීම
02. ක්‍රීඩා සමාජ පිහිටුවීම

සිදු කරන ලද අතර, පලමු අදියරට අදාලව සිදු කිරීමට නියමිත ක්‍රීඩාංගන ඉදිකිරීම් යටතේ ක්‍රීඩාංගනයක් ඉදිකර ක්‍රීඩා සමාජ සඳහා විවෘත කිරීම ද මෙම වර්ෂයට අදාලව සිදුකරන ලදි.

### 04.4.1. ක්‍රීඩා පුහුණු කරුවන් පුහුණු කිරීම

වැඩසටහනේ අරමුණු හඳුන්වාදීම, වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත ගම්මානයන්හි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේද හඳුන්වා දීම, හා සර්වෝදය අවසන් අරමුණ සඳහා මෙම වැඩසටහන යොදාගන්නේ කෙසේද යන්න හඳුන්වා දීම උදෙසා මෙම පුහුණු වැඩසටහන සිදුකෙරිණි. අදාල පුහුණුකරුවන් සඳහා අවස්ථා ගණනකදී විදේශීය හා දේශීය සම්පත් දායකයින් ගේ සහභාගීත්වයෙන් පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරුණු අතර, නිර්මාණාත්මක ක්‍රීඩා සකස් කිරීමේ කුසලතාව පුහුණුලාභී උපදේශකයන් තුල වර්ධනය කෙරුණි. මෙහිදී විවිධ වයස් කාණ්ඩ හා ජන වර්ගයන්ට අයත් කණ්ඩායම් මිශ්‍රව සම්බන්ධ කරගනිමින් සිදුකෙරෙන සහභාගීත්ව ක්‍රීඩා ක්‍රමයන් පිළිබඳව වැඩි අවධානයක් යොමුකරන ලදි' නව තාක්ෂණික ක්‍රමෝපායන් භාවිත කරමින් උක්ත අරමුණු සාක්ෂාත් කරගැනීමට ක්‍රියාත්මක වීමට අවශ්‍ය පසුබිම මෙම පුහුණුව තුළදී සම්පත් දායකයින් විසින් අදාල පුහුණුකරුවන් තුළ ගොඩනගන ලද අතර, පවතින තත්වයන් අභිබවන නව ප්‍රවේශයක් වශයෙන් මෙම වැඩසටහන සක්‍රීයව ගොඩනැගීමට අවශ්‍ය පුහුණුව වඩාත් විද්‍යාත්මකව ලබාදෙන ලදි'



ඡායා 11 දෙස් විදෙස් විශේෂඥ පුහුණුව



ඡායා 12 ගැටුම් විපර්වර්ථන ප්‍රායෝගික අභ්‍යාසයක

### 04.4.1.1. ක්‍රීඩා පුහුණු කරුවන් පුහුණු කිරීම් සඳහා සහභාගීත්වය

| දිනය | ස්ථානය | | අං | දිස්ත්‍රික්කය | සහභාගීත්වය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | ගැ | පි | මුළු |
| 2008'002'12 - 14 | සර්වෝදය සංවර්ධන අධ්‍යාපන ආයතනය බණ්ඩාරගම | දකුණු කලාපය | 01 | අම්පාර | 01 | 01 | 02 |
| | | | 02 | මාතර | 01 | 01 | 02 |
| | | | 03 | හම්බන්තොට | 01 | 01 | 02 |
| | | | 04 | නුවරඑළිය | 01 | 01 | 02 |
| | | උ/නැ කලාපය | 05 | ත්‍රිකුණාමලය/නැ | 01 | 01 | 02 |
| | | | 06 | වව්නියා | 01 | 01 | 02 |
| | | | 07 | කල්මුණේ | 01 | 01 | 02 |
| | | සම්බන්ධීකාරක වරු | | | - | 02 | 02 |
| එකතුව | | | | | 07 | 09 | 16 |

වගු අංක 06

### 04.4.2. ක්‍රීඩා සමාජ පිහිටුවීම

පුහුණු කරුවන් සඳහා වූ පුහුණුවෙන් අනතුරුව තෝරාගත් ගම්මාන සඳහා පුහුණු කරුවන් යොමු කෙරිණි. ඒ අනුව අදාල දිස්ත්‍රික්කයන්හි ගම්මාන වල මූලික ශක්‍යතා අධ්‍යයනයක් සිදුකරන ලද අතර, වැඩසටහනේ අවශ්‍යතාව වඩාත් දැනෙන එක් දිස්ත්‍රික්කයක ප්‍රදේශ 03ක විවිධ වාර්ගික හා ආගමික තලයන්ට අයත් අවුරුදු 09 ත් 19ත් අතර පිරිස් තෝරාගෙන ක්‍රීඩා සමාජ 03 බැගින් පිහිටුවන ලදි. මෙම වැඩසටහන තුළින් විවිධ වාර්ගික හා ආගමික පසුබිම්වලට අයත් කණ්ඩායම් තුළ සුහදතාව, මිත්‍රත්වය ගොඩනැගීමට අවශ්‍ය කටයුතු ක්‍රීඩාව හා විවිධ ක්‍රියාකාරකම් හරහා සිදුකරනු ලැබූ අතර, ඔවුනගේ හැකියාවන් වර්ධනය කිරීමට ද කටයුතු කෙරිණි. පවතින ගැටුම්කාරී තත්වයන් අභිබවා යමින් මෙම වැඩසටහන සඳහා විවිධ වාර්ගික ආගමික පසුබිම් වලට අයත් පිරිස් සහභාගීවූ අතර, මේ තුළ ඔවුන් ලැබූ අත්දැකීම් හා අධ්‍යාපනය ඔවුනගේ ආකල්පමය වෙනසකට හේතු වූවා මෙන්ම දෙමාපියන් වැඩිහිටියන් අතර ද දැඩි සබඳතාවක් ගොඩනැගීමට මෙම වැඩසටහන හේතුවී ඇති බව බාහිර ඇගයීම් කණ්ඩායමක් විසින් සිදුකරන ලද ඇගයීම් වාර්තා තුළ සඳහන් වේ'



**ඡායා 13** ක්‍රීඩා අභ්‍යාසයක නියලෙන සාමාජිකයින්



**ඡායා 14** එකම ගමක අපි - එකම රටක අපි

### 04.4.2.1. දිස්ත්‍රික්ක අනුව ශාන්ති සේනා සාම ක්‍රීඩා සමාජ සාමාජිකත්වය

| අංකය | දිස්ත්‍රික්කය | ග්‍රාමභාගය | සාමාජිකයින් | | | වාර්ගික පසුබිම | | | ආගමික පසුබිම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ගැ | පි | එකතු | සි | දෙ | මු | බෞ | හි | ඉ | ක්‍රි |
| 1 | මාතර | පල්ලිමුල්ල | 04 | 14 | 18 | 16 | - | 02 | 16 | - | 02 | - |
| | | ගන්දර | 13 | 28 | 41 | 25 | - | 16 | 25 | - | 16 | - |
| | | දෙනිපිටිය | 15 | 23 | 38 | 36 | - | 02 | 36 | - | 02 | - |
| 2 | හම්බන්තොට | කිරින්ද | 10 | 20 | 30 | 15 | 02 | 13 | 14 | 02 | 13 | 01 |
| | | පල්ලික්කුඩාව | 08 | 22 | 30 | 01 | - | 29 | 01 | - | 28 | 01 |
| | | සාමෝදාගම | 08 | 32 | 40 | 23 | - | 17 | 23 | - | 17 | - |
| 3 | අම්පාර | නවගම්පුර | 24 | 35 | 59 | 57 | - | 02 | 57 | - | 01 | 01 |
| | | නුගේලන්ද | 32 | 38 | 70 | 65 | 03 | 02 | 65 | 03 | 02 | - |
| | | විජයපුර | 18 | 30 | 48 | 46 | - | 02 | 46 | - | 02 | - |
| 4 | නුවරඑළිය | නවමොරපේ | 17 | 32 | 49 | 36 | 13 | - | 36 | 13 | - | - |
| | | ලැමලියර් | 21 | 45 | 66 | 52 | 11 | 03 | 44 | 11 | 03 | 08 |
| | | කුරුපනාවෙල | 26 | 30 | 56 | 38 | 18 | - | 38 | 18 | - | - |
| 5 | ත්‍රිකුණාමලය | 03 කණුව | 35 | 21 | 56 | 23 | 33 | - | 23 | 33 | - | - |
| | | දිමුතු ගම | 21 | 29 | 50 | 19 | 16 | 15 | 15 | 18 | 17 | - |
| | | විජිතපුර | 26 | 29 | 55 | 16 | 09 | 30 | 16 | 07 | 32 | - |
| 6 | කල්මුණේ | ඔලුවිල් | 17 | 25 | 42 | | | | | | | |
| | | කන්නහිපුරම් | 15 | 31 | 46 | | | | | | | |
| | | ඉස්ලාමාද් | - | 45 | 45 | | | | | | | |
| 7 | වව්නියා | මදිනානගර් | 51 | 72 | 123 | - | 16 | 107 | - | 15 | 107 | 01 |
| | | මූන්ඩ්මුරුප්පු | 48 | 102 | 150 | 20 | 129 | 01 | 20 | 114 | 01 | 15 |
| | | චිල්ලප්පර් මරදංකුලම් | 64 | 56 | 120 | - | 120 | - | - | 109 | - | 11 |
| **එකතුව** | | | **473** | **759** | **1232** | **488** | **370** | **241** | **475** | **343** | **243** | **38** |

වගු අංක 07

### 04.4.3. ක්‍රීඩාංගන ඉදිකිරීම

ක්‍රීඩාව තුළින් සාමය වැඩසටහන යටතේ පළමු අදියර තුළ අදාල දිස්ත්‍රික් මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගනිමින් ක්‍රීඩාංගන ඉදිකිරීමට කටයුතු කෙරුණු අතර, අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍රීඩාංගනය 2007'06'08 දින ඉදිකර විවෘත කරන ලදි' මේ යටතේ පසුගිය වර්ෂය තුළ ක්‍රීඩාංගන 04ක් ඉදිකරන ලදි' ඒ අනුව ඉදිකර මුළු ක්‍රීඩාංගන ගණන 05කි' මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ශාන්ති සේනා සංසදය මගින් අදාල වැඩසටහන යටතේ ලබාදෙනු ලැබූ අතර, මෙම ක්‍රීඩාංගන අදාල දිස්ත්‍රික්කයන්හි සර්වෝදය කාර්යයන් සඳහා ද පහසුවක් විය'

## 04.5. අන්තර් වාර්ගික ක්‍රීඩා වැඩසටහන

ක්‍රීඩාව හා සාමූහික විනෝදාත්මක ක්‍රියාකාරකම් තුළින් විවිධ වාර්ගික හා ආගමික තරුණ කණ්ඩායම් තුල නායකත්වය පෞරුෂය හා සුහදත්වය වර්ධනය කරලීමෙන් අන්‍යෝන්‍ය සහජීවනය සාක්ෂාත් කරගැනීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන එක් දින ක්‍රීඩා වැඩසටහනක් වශයෙන් විශේෂ සම්පත් දායක මඩුල්ලකගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කරන ලදි. මේ සඳහා සහභාගීත්වය ලබාදුන් කණ්ඩායම් ඉතා උද්යෝගයකින් යුතුව වැඩසටහන සමග කටයුතු කළ අතර, සාමූහිකත්වය ඉස්මතු වන අයුරින් ඉතා සක්‍රීය වැඩසටහන් පෙළක් මේ හරහා ක්‍රියාත්මක විය. වැඩසටහන අවසානයේ ඔවුන් සඳහා නිතර එක්වෙමින් කටයුතු කළ හැකි අනුගමනීය වැඩසටහනක් සකස්කර ගැනුණි.

## 04.5.1. අන්තර් වාර්ගික ක්‍රීඩා වැඩසටහන සඳහා සහභාගීත්වය

| අං | දිස්ත්‍රික්කය | දිනය | සහභාගීත්වය | | | වාර්ගික පසුබිම | | | ආගමික පසුබිම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ගැ | පි | මුළු | සි | දෙ | මු | බෞ | හි | ඉ | කි |
| 01 | මොණරාගල/උ | 07'09'29 | 44 | 61 | 105 | 74 | 15 | 16 | 69 | 09 | 16 | 11 |
| 02 | අම්පාර | 07'11'08 | 71 | 166 | 237 | 198 | 05 | 34 | 180 | 05 | 34 | 18 |
| 03 | කන්තලේ | 07'11' 10 | 35 | 54 | 89 | 79 | - | 10 | 77 | - | 10 | 02 |
| 04 | වව්නියාව | 07'12' 22 | 50 | 74 | 124 | 53 | 65 | 06 | 53 | 54 | 06 | 11 |
| 05 | පදවිය | 08'01'19 | 34 | 68 | 102 | 90 | - | 12 | 88 | - | 12 | 02 |
| 06 | කල්මුණේ | 08'01'19 | 74 | 103 | 177 | 08 | 91 | 78 | 08 | 76 | 78 | 15 |
| 07 | මාතර | 08'02' 23 | 54 | 108 | 162 | 136 | 17 | 09 | 128 | 17 | 09 | 08 |
| 08 | මොණරාගල/ද | 08'03' 01 | 57 | 45 | 102 | 98 | 04 | - | 97 | 04 | - | 01 |
| එකතුව | | | 419 | 679 | 1098 | 736 | 197 | 165 | 700 | 165 | 165 | 68 |

වගු අංක 08



ජායා 15 ක්‍රීඩාවට නෑ බේදයක්



ජායා 16 එක්ව ජයගමු

## 04.6. ගමට ගමක් - හදට හදක් වැඩසටහන

සුනාමි ව්‍යසනයෙන් විපතටපත් ජනතාව වෙනුවෙන් සර්වෝදය මව් සංගමය විසින් ඉදිකරන ලද ප්‍රධානතම නිවාස යෝජනා ක්‍රම තුනකට අයත්,

| | | |
|---|---|---|
| 01. කළුතර | - ලාගෝස් වත්ත සර්වෝදය ගම්මානය | - සිංහල ජනතාව |
| 02. කල්මුණේ | - නින්දවූර් සර්වෝදය ගම්මානය | - මුස්ලිම් ජනතාව |
| 03. මඩකළපුව | - වඩ්ඩවාන් සර්වෝදය ගම්මානය | - දෙමළ ජනතාව |

ගම්මාන තුනෙහි තරුණ හා ළමා ප්‍රජාව ඉලක්ක කරගනිමින් ගමට ගමක් - හදට හදක් තේමාව යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

විවිධ ජාතීන් හා ආගමිකයන් අතර තිරසාර සහජීවනය වර්ධනය කරමින්, බියෙන්, සැකෙන් හා අනවබෝධයෙන් තොරව ජීවත්වන සහයෝගීතා සමාජයක් සඳහා තරුණ ප්‍රජාව මෙහෙය වීම, තරුණ නායකත්වය හා පෞරුෂ සංවර්ධනය තුලින් අර්බුද නිරාකරණය කිරීම හා සාමය ගොඩනැගීම පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම හා අදාල ගම්මාන තුනෙහි ජීවත්වන ප්‍රජාව අතර සහසම්බන්ධතා ගොඩනැගීම යන අරමුණු උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

ක්‍රියාත්මක වැඩසටහන් පහත පරිදි වේ.

01. පෑනේ මිතුරු සම්බන්ධතා වර්ධනය කිරීම
02. ගම්මාන අතර තරුණ හුවමාරු වැඩසටහන්
03. සංස්කෘතික හා කලා හුවමාරු වැඩසටහන්
04. ක්‍රීඩා වැඩසටහන්

මෙම වැඩසටහන් විවිධ අවස්ථාවන්හිදී සංසදයේ මැදිහත්වීම යටතේ හා එම ගම්මානයන්හි ශාන්ති සේනා ඒකක හරහා ක්‍රියාත්මක කරන ලදි.

## 04.7. මොරටුව අන්තර් සහජීවන සංවර්ධන පදනම නිර්මාණය කිරීම

සර්වෝදය ව්‍යාපාරයේ කේන්ද්‍රස්ථානයව පවතින මොරටුව ප්‍රදේශය තුළ විවිධ ආගමික හා වාර්ගික කණ්ඩායම් වාසය කරන අතර" කලක සිට මෙම ආගමික කණ්ඩායම් අතර විවිධ ආරවුල් ස්වභාවයන් විටින් විට පැන නගී' මෙකී තත්වය සැලකිල්ලට ගනිමින් හා මෙම ප්‍රදේශයේ සිවිල් ප්‍රජා නායකයින්ගේ ද ඉල්ලීම අනුව ශාන්ති සේනා සංසදයේ සෘජු මැදිහත්වීම හා දායකත්වය මත මොරටුව ජනතාවගේ සහජීවනය උදෙසා කටයුතු කිරීමේ අරමුණින් ආගමික නායකයින්, සිවිල් ප්‍රජා නායකයින් හා තරුණ කණ්ඩායම් වල එකතුවෙන් "අන්තර් සහජීවන සංවර්ධන පදනම" නමින් සංවිධානයක් නිර්මාණය කරන ලදි' ඒ අනුව එහි මහාසභා වාරය 2008'02'09 දින පවත්වා එතැන් සිට එම සංවිධානය ශාන්ති සේනාව කේන්ද්‍ර කරගනිමින් ස්වාධීනව කටයුතු කරගෙන යයි' මේ වන විට එම සංවිධානය හරහා මූලික අරමුණු සාක්ෂාත් කරගනු පිණිස වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කොට ඇත'


## තරුණ නායකත්වය
## හා
## පෞරුෂ සංවර්ධනය
## සඳහා වූ වැඩසටහන්

සතුටේ සුවයේ සාමේ
සලසමු ලක් ජනතා . . . . . .

මනුෂ්‍යත්වයේ පුරුෂාර්ථයන් බිඳවැටෙමින් පවත්නා මෙවන් යුගයක වෙන කවරදාකටත් වඩා සමාජ නායකයින් අවශ්‍යව ඇත. ඔවුනොවුන්ගේ පෞද්ගලික අභිමතාර්ථයන් ඉටුකර ගැනීමේ යටි න්‍යාය පත්‍රයෙන් සමාජයට බට නායකයින් ගෙන් බහුතරයක් ඉහල පුටු වලදී මනුදම් අමතක කර දැමීම ජාතියේම අවාසනාවකි.

එහෙයින් අවසාන ගමේ සිට ජාතික තලය දක්වා සමාජය මනුෂ්‍යත්වයේ දිශානතියට ගෙනයාහැකි පෞරුෂවත් නායකයින් බිහිකිරීමේ උත්තුංග අභිලාෂය වෙනුවෙන් කුඩා පියවරක් තැබීමට ශාන්ති සේනාව කටයුතු කරන ලදි.

මෙහි සඳහන් සෑම වැඩසටහනක් තුළම මෙකී අරමුණ සාක්ෂාත් කරගනු පිණිස අරමුණු සකස්වී ඇතිමුත්, මෙම වැඩසටහන් සෘජුවම නායකත්ව කුසලතා සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක විය.



## 04.7. ශාන්ති සේනා සාම බලකා පුහුණු (ව්‍යාපෘති රහිත)

ශාන්ති සේනා වැඩසටහන සඳහා දිස්ත්‍රික්කයන්හි ඇති කැමැත්තත්, වැඩසටහන තුල ගොඩනැගී ඇති තරුණ ශක්තියත් මත, ඉල්ලුම් කරන ලද දිස්ත්‍රික්කයන්හි අවශ්‍යතාවය මත, ව්‍යාපෘති රහිත වූව ද පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කෙරුණි. මෙහිදී ශාන්ති සේනා වැඩසටහන එම දිස්ත්‍රික්කවල ගම්මානයන්හි ස්ථාපිත කිරීමටත්, එම ඒකකයන්හි සාමාජිකයින්ගේ පෞරුෂ සංවර්ධන ක්‍රියාවලියක් උදෙසා ක්‍රියාත්මක වීමටත් අවශ්‍ය පුහුණුව, මෙම නායකයින් වෙත ලබා දෙන ලදි. අදාල ප්‍රදේශයන්හි පවතින තත්වයන් හා අවශ්‍යතා හඳුනාගනිමින් විශේෂයෙන් ප්‍රථමාධාර සේවා සඳහා තරුණ ප්‍රජාව යොදා ගැනීමටත්, පරිසර සංරක්ෂණ ක්‍රියාවලි වැනි සේවාවන් සැපයීම සඳහා යෝග්‍ය කණ්ඩායමක් නිර්මාණය කිරීම සඳහාත්, මෙම කණ්ඩායම් වෙත න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම මෙහිදී සිදු විය.

### 04.7.1. සාම බලකා පුහුණු සඳහා සහභාගීත්ව තොරතුරු

| අංක | ස්ථානය | දිනය | දිස්ත්‍රික්ක | සහභාගීත්වය | | |
|---|---|---|---|---|---|---|
| | | | | ගැ | පි | මුළු |
| 01 | පහලගලතුර විහාරස්ථානය | 2007'08'14 - 17 | රත්නපුර | 11 | 19 | 30 |
| මුළු එකතුව | | | | 11 | 19 | 30 |

වගු අංක 09

## 04.8. ග්‍රාමස්වරාජ්‍ය ගම්මාන නායකත්ව පුහුණු

ශාන්ති සේනා වැඩසටහන වඩාත් සක්‍රීය කිරීම දැඩි අවශ්‍යතාවක්ව පවතින බවට ක්ෂේත්‍ර කටයුතු වලදී සංසදයට ලැබුණු අවබෝධයත් සමග ජනතා තරුණ සංවිධානයක් ලෙස සර්වෝදය අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා තරුණ එකමුතුවක් ඇති කිරීමේ අරමුණින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ග්‍රාම ස්වරාජ්‍ය ගම්මාන ඉලක්ක කර ගත් මෙම කාර්යයෙහිදී රට තුළ පසුගිය වකවානුව ඇතිකරන ලද ව්‍යාපෘති හා ප්‍රතිපාදන මත යැපීමේ ආකල්පය අභිබවා යමින් සැබෑ තරුණ සංවිධානයක් වශයෙන් කටයුතු කිරීම සඳහා තරුණ පිරිස් අභිප්‍රේරණය කිරීම මේ තුළින් සිදුකරන ලදි. මේ යටතේ වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලද අතර, මෙම කාලයට අදාලව පුහුණු දෙකක් පමණක් ක්‍රියාත්මක කරන ලදි. ඉදිරියටද මෙම වැඩසටහන් සක්‍රීයව ක්‍රියාත්මකය.

### 04.8.1. ග්‍රාමස්වරාජ්‍ය ගම්මාන පුහුණු සඳහා සහභාගීත්වය

